# පිටරට ඉගෙනීම සහ අතරමංවීම

**මේ** දවස්වල ලංකාවෙ ඉරිදා පළවෙන සිංහළ ඉංග්‍රීසි පත්තර ගත්තම ඒවායෙ පිරෙන්න තියෙනවා වෙළඳ දැන්වීම් එංගලන්තෙ ඕස්ට්‍රේලියාවෙ උසස් අධ්‍යාපනය ලබන්න උපාධි පාඨමාලා හදාරන්න. මේවා දැක්කම ලංකාවෙ හැම අම්ම තාත්ත කෙනෙකුටම හිතෙන එක අහන්න දෙයක් නෙවෙයි තමන්ගෙ දරුවා පිටරට ඇරලා උගන්නන්න. හැම ඉස්කෝලෙ යන ළමයෙකුටම වගේම ස්කෝලෙන් අස්වෙලා ඉන්න ළමයෙකුටත් හිතෙන්න පුළුවන් 'අනේ මටත් අවස්ථාවක් ලැබුණොත් එංගලන්තෙට හරි ඕස්ට්‍රේලියාවට හරි ගිහිං උපාධියක් කරලා එන්න' කියලා.

ඒ හැම කෙනෙක්ම තමන්ගෙ ආශාවන් ඉෂ්ටකරගන්න ණය තුරුස් වෙලා, එහෙම නැත්නම් තියෙන දේපළත් විකුණලා, නැත්තම් උගස් තියලා හරි උපාධියට ගෙවන්න සල්ලි හොයා ගන්නවා. වෙළඳ දැන්වීමෙ තියන උසස් අධ්‍යාපන ආයතනයට සල්ලි බඳින්න කලින් පොඩ්ඩක් බලන්නෙ නෑ මේක බ්‍රිතාන්‍ය රජයේ හෝ ඕස්ට්‍රේලියන් රජයෙන් අනුමත කරපු එකක්ද කියලා.

එංගලන්ත රජයෙන් අනුමත කරපු හැම උසස් අධ්‍යාපන ආයතනයකම සත්‍ය තොරතුරු හා විස්තර ලංකාවෙ බ්‍රිතාන්‍ය තානාපති කායර්‍ාලයට අනුබද්ධිත බ්‍රිතාන්‍ය කවුන්සිලයේ තියනවා. එංගලන්තෙ කොලීජියකට සල්ලි ගෙවන්න කලින් ඔය කොළඹ බ්‍රිතාන්‍ය කවුන්සිලයට ගිහින් සොයලා බැලුවොත් දැනගන්න පුළුවන් හැබෑ එකක්ද ව්‍යාජ එකක්ද කියලා. එංගලන්තෙ කඩ සාප්පු ගාණටම පොඩි පොඩි හොර අධ්‍යාපන ආයතන ඕන තරම් මේ එංගලන්තෙ තියනවා. සමහර ඒවා බෝඩ් ලෑලිවලට විතරක් සීමා වෙච්ච ඒවා. පොඩි කඩ කාමරයක් අරගෙන හොර බිස්නස් කාරයෝ ඒක උසස් අධ්‍යාපනය දෙන ආයතනයක් හැටියට ලියාපදිංචි කරගන්නවා. නමුත් ඒවා වලින් දෙනවාය කියන හොර උපාධි පාඨමාලාවලට එන්න ලංකාවෙ බ්‍රිතාන්‍ය තානාපති කායර්‍ාලයෙන් වීසා දෙන්නෙ නෑ. ඒ තැන්වල ඇත්තටම එහෙම පාඨමාලා ඇත්තෙ නෑ. වීසා නොලැබුණාම අර ගෙවපු සල්ලි ටික ආපහු ගන්න එක නම් මේ ආත්මේදි කෙරෙන්නෙ නෑ.

එංගලන්තෙ උසස් අධ්‍යාපනය ලබන්න කැමති අයට ඒ සඳහා සේවය ලබාදෙන්න ඒජන්සිකාරයොත් ලංකාවෙ වැහිවැහැලා. ඒ ගොල්ලන්නෙ ගාස්තුව ඇහුවම කලන්තදාල වැටෙනවා ඒජන්සි කාරයා අපිට කරන්න බැරි දෙයක් කරන්නෙ නෑ. ඉල්ලුම් පත්‍රය පුරවලා සහතික පිටපත් එක්ක එංගලන්තෙ විශ්ව විද්‍යාලෙට හරි අධ්‍යාපන ආයතනයට හරි තැපැල් කරනවා. ඊට පස්සෙ විශ්වවිද්‍යාලෙන් ලැබෙන පිළිතුරු ලිපිය ඉල්ලුම් කරුට පෙන්නලා සල්ලි ඉල්ල ගන්නවා විශ්වවිද්‍යාලෙට ගෙවන්න. හැබැයි පාඨමාලා ගාස්තුව වගේ දෙගුණයක්. ඊට පස්සෙ වීසා ඉල්ලුම් පත්‍රය පුරවනවා වීසා ගන්න. ඇත්තට මේ වැඩේට අතර මැදියො අවශ්‍ය නෑ. තමන්ටම කරගන්න පුළුවන්. බ්‍රිතාන්‍ය කවුන්සිලයට ගිහිල්ලා තමන් කැමති පාඨමාලාවක් තෝරගෙන ඊල්ලුම් පත්‍රයක් දාගන්න එක අමාරු වැඩක් නෙවෙයි. උපදෙස් දෙන්න කාර්ය මණ්ඩලයක් එතන ඉන්නවා. ඒජන්සි කාරයො ඉල්ලුම්කරුගෙනුත් ගාස්තුවක් ගන්නවා. ඊට පස්සෙ එංගලන්තෙ අර උපාධි කඩෙනුත් කොමිස් ගන්නවා. බ්‍රිතාන්‍ය කවුන්සිලේ මාර්ගයෙන් ඉල්ලුම් කරනවා නම් රුපියල් ලක්ෂ ගණනක් ඉතුරු කරගන්න පුළුවන්. අතර මැදියන්ට සල්ලි ගෙවන්න අවශ්‍ය වෙන්නෙ නෑ. හොඳම ක්‍රමය තමයි ඒක.

වීසා ඉල්ලුම් පත්‍රය කොළඹ තානාපති කාර්යාලයට ඇරියට පස්සෙ අතර මැදි කාක්කා ඒකටත් ඇඟිලි ගහනවා. මේ දැනට මාස තුනකට ඉහත වෙච්ච ඇත්ත සිද්ධියක්.

ගම්පහ ගෑණු ළමයෙක් එංගලන්තෙ උසස් අධ්‍යාපනය ලබන්න අවශ්‍ය ලියකියවිලි සේරම ලෑස්ති කරගෙන වීසා ඉල්ලුම් කළා. පළවෙනි සැරේ වීසා ප්‍රතික්ෂෙප වුණා. ඒ ළමයගෙ ලන්ඩන් ඉන්න මාමා බ්‍රිතාන්‍ය ආගමන විගමන දෙපාර්තමේන්තුවට ඒ ප්‍රතික්ෂෙප කිරීම ගැන අහලා ලියුමක් ඇරියා. ඒ ඉල්ලීම නිසා කලින් තීරණය වෙනස් කරලා වසර දෙකකට වීසා දෙන්න තීරණය කරලා ඒ තීන්දුවෙ පිටපතක් ලංකාවෙ බ්‍රිතාන්‍ය මහකොමසාරිස් කායර්‍ාලයට ඇරලා තව පිටපතක් ලන්ඩන් මාමටත් යවලා තිබුණා. මේ තීන්දුව දුන්නෙ 2008 නොවැම්බර් මාසෙ. මාමා මේ බව ගෑණු ළමයට කියලා යැව්වා වීසා වැඩේ දැන් හරි කියලා.

අර ගෑණු ළමයා කොළඹ බ්‍රිතාන්‍ය තානාපති කායර්‍ාලයට ගිහිල්ලා ඇහුවම එතනින් කිව්වා, එහෙම දෙයක් අපි දන්නෙ නැත කියලා. සතියකට දෙතුන් වතාවක් ගියා, දුරකතන ඇමතුම් ගත්තා, හැමදාම ලැබුණෙ එකම උත්තරයයි. එහෙම වීසා එකක් ආවෙ නෑ කියලා. මාමා එංගලන්තෙ ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් ඇහුවම කියලා තියනවා "අපි ඒ ලියවිල්ල ඇරලා හුඟක් කල්, නැතිවෙන්න විදියක් නෑ අපි යවන්නෙ විශේෂ ක්‍රමයකට " කියලා.

මේ විදියට මාස දෙක තුනක් ගියා තවම අර ලියුම නෑ. දවසක් අර ගෑණු ළමයගෙ ගම්පහ ගෙදරට ටෙලිපෝන් කෝල් එකක් ආවා නාඳුනන පුද්ගලයෙකුගෙන්. " මට පුළුවන් ඔයාට එංගලන්තෙට යන්න වීසා අරගෙන දෙන්න. මම සාමාන්‍යයෙන් ඒකට රුපියල් ලක්ෂ පහළොවක් අය කරනවා. නමුත් ඔයාට කරන විශේෂ සැලකීමක් හැටියට ලක්ෂ නවයකට වැඩේ කරලා දෙන්නම් " කියලා.

ගෑණු ළමයා කිව්වා, " මගේ වීසා අනුමත කරලා එංගලන්තෙන් මෙහාට එවලයි තියෙන්නෙ, ඒ නිසා මට සල්ලි ගෙවන්න හේතුවක් නෑ" කියලා. " අනික තානාපති කායර්‍ාලෙ මගේ වීසා විස්තර ඔයා කොහොමද දන්නෙ? කවුද ඔයාට මගේ ටෙලිපෝන් නොම්මරේ දීලා මට කතාකරන්න කිව්වෙ? " ගෑණු ළමයා එහෙම ඇහුවම ඒ මෑන් කියලා තියනවා, " අපි තමයි වීසා අනුමත කරන්නෙ. ඔයා සල්ලි ගෙවන්න කැමති නම් වීසා ලැබෙයි. නැත්නම් ඉතින් එංගලන්තෙ යන්න ලැබෙන්නෙ නෑ " කියලා.

මේ කතාව ඇහුවම ඒ ළමයගෙ ඔළුව ගිනිගත්තා, රුපියල් ලක්ෂ නවයක් කොහෙන් හොයන්නද? තානාපති කායර්‍ාලෙට කොයිතරම් කතා කළත් කියනවා, ලියුම තාම ඇවිත් නෑ කියලා. පැමිණිල්ලක් කරන්න වුනත් තානාපති කායර්‍ාලෙ ඇතුළට යන්න විදියක් නෑ.

ඒ ගෑණු ළමයා ලන්ඩන්වල මාමට ටෙලිපෝන් කරලා විස්තරේ කිව්වම, මාම මේ ප්‍රශ්නය ඒ ළමයා ඇතුල්වෙන්න හිටි විශ්වවිද්‍යාලෙට දැනුම් දුන්නා. හොඳ වෙලාවට ඒ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් දෙන්නෙක් කොළඹ පැවැත්වුණු අධයාපන වෙළඳ පොළට යන්න ලෑස්තිවෙලා හිටියෙ. ඒ අය ගෑණු ළමයගෙ ලිය කියවිලි අරගෙන ගිහිං ඒ වෙළඳ කුටියට යාබදව තිබුණු බ්‍රිතාන්‍ය මහකොමසාරිස් කාර්යාල කුටියට ගිහිල්ලා මේ විස්තරේ ඒ නිළධාරීන්ට කිව්වම, ඒ ගෑණු ළමයට එන්න කියලා දැනුම් දුන්නා. දින දෙකකට පස්සෙ බ්‍රිතාන්‍ය තානාපති කයර්‍ායලට අඬගහලා සියළු විස්තර සටහන් කරගෙන පාස්පෝට් එකේ වීසා ගහලා දුන්නා. මේ වෙච්ච දේ ගැන පරීක්ෂණයක් පවත්වන බවට තානාපති කායර්‍ාලය පොරොන්දු වුණා. එච්චරයි. අර සල්ලි ඉල්ලපු නාඳුනන පුද්ගලයා තවම කාටත් අබිරහසක්.

මේ වගේ වංචාකාරයෝ හැම තැනම. ඒජන්සිකාරයෝ, තරව්කාරයෝ එංගලන්තෙ යන්න කැමැත්තෙන් ඉන්න තරුණ ළමයින්ව අවුස්සනවා ගල් පැලෙන බොරු කියලා. එංගලන්තෙ ඕන තරම් රස්සාවල් තියෙනවා, හොඳට හම්බ කරන්න පුළුවන්. එංගලන්තෙ ජීවිතේ ගැන කිසිම අවබෝධයක් නැති අය මේ කතා වලට ඉබේම අහුවෙනවා.

මෙහෙම රැවටිලි බස් අහලා එන ළමයි ආවම එංගලන්තෙ ජීවත්වෙන්න හුඟාක් කරදර වලට මූණ පානවා. ඊට වැඩිය තවත් පරිස්සම් වියයුතු දේවල් තියනවා. සමහර උසස් අධ්‍යාපන ආයතන විදේශ රටවලට ගිහිං ඒජන්සිකාරයින්ගෙ මාර්ගයෙන් ඒ ආයතන වලට ශිෂ්‍යයින් බඳවා ගන්නවා. ඒ දැන්වීම්වල සඳහන් කරනවා හැම අංශවලටම උපාධි තමන් ළඟ තියන බව. ආවමයි දන්නෙ ඒ කියපුවා මුකුත් නැති බව. ගෙවපු සල්ලි ආපහු ගන්න බෑ. සමහර ආයතන බංකොළොත් වෙලා මාසෙන් දෙකෙන් වහනවා. අර ආපු ළමයි අතරමං වෙනවා. ඒ ගෙවපු සල්ලි වලට වගකියන්න කෙනෙක් නෑ. කිසිම රජයකින් මේ කිසිම දේකට කිසිම බැඳීමක් නෑ.

මේ අවුරුද්දෙ බ්‍රිතාන්‍ය රජය මේ වංචනික උසස් අධ්‍යාපනකාරයො අයින් කරලා අළුත් ලැයිස්තුවක් හැදුවා. දැන් තානාපති කායර්‍ාල වලින් වීසා දෙන්නේ ඒ අනුමත ලැයිස්තුවේ සිටින ආයතන වලට පමණයි. ඒ ලැයිස්තුව අන්න කොළඹ බ්‍රිතාන්‍ය කවුන්සිල් එකේ තියනවා.

♦ ***ආර්නෝල්ඩ් කුමාරසිංහ*** Walthamstow **London E 17**




**ලන්ඩනයේ ශිෂ්‍යයින් වෙනුවෙන් පළවන සඟරාවක දැනට වසා දමා ඇති බොරු අධ්‍යාපන ආයතන වල පින්තූර සමග මෙහි පළකර ඇත්තේ ලන්ඩනයට එන පිටරට ශිෂ්‍යයින් කරකියා ගන්නට දෙයක් නැතිව අතරමං වන ආකාරය සහ ඔවුන්ට අනතුරු ඇඟවීමක්ය. .**

# සුපර් මෝඩයින් සඳහා සුපර් යන්ත්‍රරාජයා

**මේ** සමග පළවන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජාතික පුවත්පතක පළවූ දැන්වීමකි. එහි මෙසේ දැක්වේ.

**සුපර් ස්ටාර්** සහ **ඩ්‍රීම් ස්ටාර්** සඳහා යන ඔබට ජය සිකුරුයි. විනිසුරු මඩුල්ලේ හා ලක්වාසීන්ගේ ආකර්ශණය ඔබට ලබා දෙන, ඔබේ සබකෝලය දුරුකර ප්‍රකාශන ශක්තිය ලබාදෙන මෙම සර්ව වශී යන්ත්‍රය නොපෙනෙන්නට සාක්කුවේ ගෙන යා හැක.




මේ ලංකාවේ අළුත්ම ගසාකෑමයි. එනම් සුපර් ස්ටාර් සඳහා ඉදිරිපත්වන අයට යන්තර බලයෙන් දිනුම ලබා දීමයි. දැන් ලෝකයේ ටෙලිවිෂනයට වැළඳුණු අළුත්ම පිස්සුව සුපර් ස්ටාර් තේරීම. මේක ලංකාවටත් තදින්ම බෝ වෙලා. දැන් ලංකාවෙ හැමෝම සිංදු කියන්න පටන් අරන්. බාබර්ලත් සිංදු කිය කිය කොණ්ඩෙ කපන්නෙ. මේ දැන්වීමේ හැටියට මෙම යන්ත්‍ර වශීය සාක්කුවේ තබා ගෙන සිංදුව කිව්වම කොපමණ බෙලෙක් කටහඬක් තිබුණත් විනිසුරු මඩුල්ලේ වැඩිම ලකුණු ලැබෙනවා. යන්තරේ බලයෙන් නරඹන්නන්ගේ මොබයිල් පෝන් වලින් ඉබේම වශීය සාක්කුවේ ඇති පුද්ගලයාට පමණක් SMS හෝ ගා වැටෙන්නට පටන් ගනී. ගිය මාසයේ පුවත්පතක වෙඩි නොවදින යන්ත්‍රරාජයෙක් ගැන දැන්වීමක් තිබුණි. ෂහ්! මාස දෙකකට ඉස්සෙල්ලා මුලතිව් පැත්තෙ ගියා නම් ඒ යන්තර ටික සුසෙයිලා පොට්ටු අම්මාන්ලා පැන පැන ගනීවි කියලා මට හිතනවා.

